# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1680/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 06 /11 /2024
පැය 2150

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - තලාතුඔය පොලිස් වසම.

2024.11.05 වන දින අළුයම් කාලයේදී තලාතුඔය පොලිස් වසමේ උඩුදෙනිය ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් ඝාතනය කර ඇති බවට තලාතුඔය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 70 ක් වූ උඩුදෙනිය මාරස්සන ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය සිය සැමියා සමග නීලවල පාර උඩුදෙනිය ප්‍රදේශයේ පිහිටි නිවසේ පදිංචිව සිට ඇති අතර 2024.11.05 වන දින අළුයම් කාලයේ නිවසට ඇතුලු වූ නාදුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් මරණකාරියගේ රන් භාණ්ඩ කොල්ලකා ඇයව ගෙල සිරකර ඝාතනය කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා තලාතුඔය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කෑගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2024.10.28 වන දින කෑගල්ල පොලිස් වසමේ කොස්සින්න ප්‍රදේශයේ නිවසක පදිංචිව සිටි වයස අවුරුදු 75 ක පිරිමි පුද්ගලයෙකුගේ අත් පා ගැට ගසා මුඛයට ප්ලාස්ටර් අලවා ගෙල සිරකර ඝාතනය කර නිවසේ තිබූ කාර් රථය සොරකම් කරගෙන ගොස් ඇති බවට කෑගල්ල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත කෑගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය විසින් විමර්ශනය කර 2024.11.04 වන දින මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවන් දෙදෙනෙකු හා සැකකාරියක් පිළියන්දල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 හා 36 යන වයස්වල පසුවන ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචිකරුවන් වන අතර සැකකාරිය වයස අවුරුදු 54 ක් වන නාවින්න ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මොවුන් විසින් රැගෙන යන ලද කාර් රථය පිලියන්දල ප්‍රදේශයේ දමාගොස් තිබියදී මීට පෙර සොයාගෙන තිබූ අතර සැකකරුවන් මීට පෙර බන්ධනාගාර ගතව සිටි අයවලුන් බවටත්, සැලසුම් සහගතව මෙම අපරාධය සිදුකර ඇති බවටත් දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

කෑගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**